# ගර්භිණී, ප්‍රසව සහ සූතිකා පරිචර්යා පිළිබඳ සමීක්ෂණාත්මක අධ්‍යයනයක්

නිවන්තක ඩබ්. ජී. කේ.[1], කුමාර ජී. යූ. ඒ.[2], තිසේරා එම්. එච්. ඒ.[3]
[1]ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.
[2]කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.
[3]ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

**සංක්ෂිප්තය**

ශ්‍රී ලාංකේය දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවෙන ඉතිහාසයකට උරුමකම් කියයි. වරින් වර ඇති වූ විදේශ ආක්‍රමණ නිසා මෙම වෛද්‍ය කර්මය හායනකට ලක් වුවත් ඇතැම් අවස්ථා එහි ප්‍රගමනයට හේතු සාධක වූ බවක් ද පෙනී යයි. කෙසේ වෙතත් අප රට තුළ ඉතා දියුණු වෛද්‍ය ක්‍රමයක් පැවතුණ බවට සාක්ෂි අදටත් ජීවමාන ව පවතී. මීමුරේ සහ හෙනානිගල ජනපද යනු එවැනි ජීවමාන සාක්ෂි අදටත් ඉතිරි ව පවත්නා මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ලකේගල පර්වතය පාමුල සහ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ උල්හිටිය - රත්කිඳ ජලාශවලට මායිම් ව පිහිටා ඇති සුන්දර ගම්මාන දෙකකි. මීමුරේ සහ හෙනානිගල ජනපදවල ජනතාව භාවිත කළ සහ කරන ගර්භිණී, ප්‍රසව සහ සූතිකා පරිචර්යා පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම සමීක්ෂණයේ අරමුණ විය. මෙම ජනපදය තුළ ජීවත් වන වින්නඹු මාතාවක් ලෙස කටයුතු කළ හෝ කරන වින්නඹු මාතාවන් දස දෙනෙකු හමු වී සාදාගන්නා ලද ප්‍රශ්නාවලියට අනුව ඔවුන් සමග සිදු කරන ලද සහභාගීත්ව සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් මෙම සමීක්ෂණය සඳහා දත්ත රැස්කර ගන්නා ලදී. ඔවුන් තම වෙදකම සඳහා ඖෂධ, මන්ත්‍ර-ගුරුකම් සහ ශාන්ති කර්ම යනාදිය එක හා සමාන ව යොදා ගන්නා බවත්, ගැබිනි මවගේ ආහාර සහ ඇවතුම්-පැවතුම් කෙරෙහි විශේෂතාවක් නොදක්වන බවත් සමීක්ෂණයේ දත්ත පෙන්වා දෙයි. එසේ ම ඔවුන් සතු ව ගර්භය, ගර්භිණිය, ප්‍රසූතිකාව සහ සූතිකාව සම්බන්ධයෙන් මනා දැනුමක් පැවති බව ද පැහැදිලි වෙයි. මාසානුමාසික ගර්භ සහ ගර්භිණී ලක්‍ෂණ, දුහිතෘ ලක්‍ෂණ, ගර්භිණී මවට ඇතිවන උපද්‍රව තත්ත්ව, ආසන්න ප්‍රසව ලක්ෂණ, ප්‍රසව ව්‍යාපත්, ප්‍රසව පරිචර්යා, සූතිකා පරිචර්යා සහ සූතිකා රෝග මෙන් ම නවජාත පරිචර්යා පිළිබඳ ඔවුන් සතු දැනුම ඇතැම් තැනක දී ආයුර්වේදය අභිබවන බව ද පෙනී යයි. තව ද ඔවුන් සතු ව මේවා හැඳින්වීම සඳහා විශේෂිත වූ වචන මාලාවක් ද පවතින බව හඳුනාගත හැකි විය. මේ අනුව අප රට තුළ ගර්භිණී, ප්‍රසව සහ සූතිකා පරිචර්යා පිළිබඳ හසල දැනුමකින් පෝෂිත දේශීය වෛද්‍ය ක්‍රමයක් පැවති බවත් එහි ශේෂයන් අදටත් ජීවමාන ව පවතින බවත් නිගමනය කළ හැක.

**ප්‍රමුඛ පදඃ** දේශීය වෛද්‍ය ක්‍රමය, ලකේගල පර්වතය, උල්හිටිය - රත්කිඳ ජලාශය, වින්නඹු මාතාව

**විද්‍යුත් ලිපිනයඃ** guakumara@gmail.com